www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

ශ්‍රී ලංකාව

# දකුනු පලාත් සභා මැතිවරනයේදී සසප ට ජන්දය දෙන්න

## Sri Lanka: Vote SEP in the Southern Provincial Council election

**සමාජවාදී සමානතා පක්ෂයේ ප්‍රකාශනය**

**2009 ඔක්තෝබර් 09**

සෙනසුරාදා පැවැත්වෙන දකුනු පලාත් සභා ජන්දයේදී සමාජවාදී සමානතා පක්ෂයේ (සසප) අපේක්ෂක ලැයිස්තුව වෙනුවෙන් ජන්දය පාවිච්චි කරන ලෙස අපි ගාලු දිස්ත්‍රික්කයේ සියලු කම්කරුවන්ගෙන්, ගොවීන්ගෙන් හා තරුනයන්ගෙන් ඉල්ලා සිටිමු.

කොලඹ දේශපාලන සංස්ථාපිතයේ සියලු පක්ෂවල බෙදුම්වාදී වර්ගවාදයට එරෙහිව ජාත්‍යන්තර සමාජවාදය සඳහා සටන් වදින්නේ සමාජවාදී සමානතා පක්ෂය සමනි. අප උද්ඝෝෂනය කරන්නේ, ජනාධිපති මහින්ද රාජපක්ෂ හා ඔහුගේ ආන්ඩුව විසින් පාගා දමා ඇති සිංහල, දෙමල හා මුස්ලිම් කම්කරුවන්ගේ මෙන්ම දුගීන්ගේ ද, පොදු පන්ති අවශ්‍යතා හා ප්‍රජාතන්ත්‍රීය අයිතීන් ආරක්ෂාකර ගැනීමේ අරගලය සඳහා ඔවුන් අතර එක්සත්කම ගොඩනැගීමට ය.

පාලක පන්තියේ පක්ෂ, සෑම ප්‍රධාන ප්‍රශ්නයකදීම ආන්ඩුවේ පිලිවෙත් සමග ඔවුන්ට ඇති ඇයි හොඳයිකම් මධ්‍යයේම, යෙදීගෙන සිටින්නේ විරුද්ධ පක්ෂ වලට එරෙහිව පෙර නොවූ විරූ ආකාරයේ මැරවර කමේ හා බියගැන්වීමේ මැතිවරන ව්‍යාපාරයක ය. ඡන්දදායකයන් බියවැද්දීම හා විරුද්ධ පක්ෂවල මැතිවරන කාර්යාල ගිනිබත් කිරීම සඳහාත්, ආන්ඩුවේ සම්පත් හා අරමුදල් සීමාන්තිකව විය පැහැදම් කිරීම සඳහාත්, ආරක්ෂක හමුදා සාමාජිකයන් හා මැරවරයන් යොදාගැනීම ඇතුලු, මඩිස්සලයේ ඇති සෑම පූජාතන්ත්‍ර විරෝධී තුරුම්පුවක්ම, සිය ජයග්‍රහනය සහතික කර ගැනීම සඳහා ඔවුන් පාවිච්චියට ගෙන තිබේ. මැතිවරන නිරීක්ෂනයේ යෙදී සිටින පැෆරල් සංවිධානය, ඔක්තෝබර් 6 දින වනවිට මැතිවරන නීති උල්ලංඝනය කිරීමේ සිද්ධීන් 180 ක් වාර්තාකොට තිබුනි.

මෙවන් ක්‍රමවේදයන්ට නැඹුරුවීම මගින් පෙන්නුම් කරන්නේ ආන්ඩුවේ බෙලහීනත්වය පමනි. මැයි මාසයේ බෙදුම්වාදී එල්ටීටීඊ ය මිලිටරිමය වශයෙන් පරාජය කිරීම පිලිබඳ පම්පෝරිය හැරෙන්නට ආන්ඩුවේ මැතිවරන වැඩ පිලිවෙල තුල වෙනත් කිසිවක් ඇත්තේ නැත. කම්කරුවන් හා තරුනයන් බොහොමයක් රාජපක්ෂගේ මුසාවාද ගැන ප්‍රශ්න කිරීමට පටන් ගෙන තිබේ. යුද්ධයේ අවසානය, තව තවත් ආර්ථික අමාරුකම් හා ප්‍රජාතන්ත්‍ර විරෝධී කුරිරු පියවර මිස සාමය හා සමෘද්ධිය ගෙනැවිත් ඇත්තේ නැත. රටතුල දෙමල ජනතාවට එරෙහි වාර්ගික යුද්ධය, රාජපක්ෂගේ "ආර්ථික යුද්ධය" මගින් ඌන පූරනය කර තිබේ. ඒ, රට මුහුනපා ඇති ආර්ථික අර්බුදයේ බර වැඩකරන ජනතාවගේ කර මත පැටවීම සඳහා ය.

1983 යුද්ධය ආරම්භවූ අවස්ථාවේ පටන්ම සසප, දෙමල ජනතාවගේ ප්‍රජාතන්ත්‍රීය අයිතීන් බලහත්කාරයෙන් මැඩීමට දරන උත්සාහය, සමස්තයක් වශයෙන් කම්කරු පන්තිය හා පීඩිත ජනතාවන්ගේ අයිතීන් හා ජීවන තත්ත්වයන්ට එරෙහිව ද කඩාපාත් කිරීම නොවැලැක්විය හැකි බව ගැන අනතුරු අඟවා තිබේ. එම අනතුරු ඇඟවීම මේ වන විට මුලුමනින්ම සනාථ කරනු ලැබ ඇත. කම්කරුවන්ට හා ගම්බද දුගී ජනතාවන්ට, රාජපක්ෂගේ "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය" යන ප්‍රෝඩාව වෙනුවෙන් කැප කල යුතු බව කියා සිටි අතර දැන් ඔවුන්ට, දැවැන්ත මිලිටරි වියදම් සඳහා මෙන්ම, 1930 ගනන් වලින් මෙපිට ඇතිවූ ධනවාදයේ නරකම ගෝලීය අර්බුදයේ ප්‍රතිවිපාකයන් වෙනුවෙන් ද ගෙවීමට බලකෙරී ඇත.

ලොව වටා සිදුවන ආකාරයටම, මෙරට කම්කරුවන් ද මුහුන පා ඇත්තේ, සිය ජීවන කොන්දේසි මත එල්ල කෙරෙන දැවැන්ත

ප්‍රහාරයකටය. ආන්ඩුව, රාජ්‍ය අංශයේ වැටුප් වැඩිවීම් හා රැකියා සැපයීම් අත්හිටුවා ඇත. සමාජ ශුභසාධන වියදම් හා සහනාධාර කපා හැර ඇත. පෞද්ගලික සමාගම් ද එයම අනුගමනය කරති. මෙහි ප්‍රතිපලයක් වශයෙන් වැඩකරන ජනතාව, භාන්ඩ හා සේවා සඳහා නව බදු පැනවීමේ හේතුව නිසා ද අහස උසට නැගෙමින් තිබෙන මිල ගනන් හමුවේ ජීවිතය ගැටගසා ගැනීමේ දුෂ්කරතාවන්ට වඩ වඩාත් මුහුන පාමින් සිටියි. සමාජයේ වඩාත්ම දුගී කොටස් තම වේල පිරිමසා ගැනීමේ තැනටම ඇද වැටී තිබේ.

තරුනයන්ට සරලව ම ධනවාදය යටතේ අනාගතයක් ඇත්තේ නැත. රාජපක්ෂ බලයට පත්වූ තැන් පටන් ආන්ඩුව සපයා ඇත්තේ වසරකට රැකියා 1,500 ක් බැගින්වූ, සොච්චම් සිවිල් රැකියා 6,000 ක් බව කම්කරු ඇමති අතාවුද සෙනෙවිරත්න මෑතක දී ප්‍රකාශ කලේය. රාජ්‍ය හෝ පෞද්ගලික අංශවල පුරප්පාඩු ඇත්තේ නැත. උතුරේ හා නැගෙනහිරේ පැරනි යුද කලාප දැවැන්ත හමුදා සංකීර්නයන් බවට පත්කිරීමේ ආන්ඩුවේ සැලසුම් ක්‍රියාත්මක වන විට රැකියා ඇති එකම තැන බවට පත්වන්නේ මිලිටරිය යි. දහස් ගනනක් විශ්ව විද්‍යාල උපාධිධාරීහු විරැකියාවෙන් පෙලෙති. උසස් පෙල විභාගයට පෙනී සිටින තරුනයන්ගෙන් අඩුම තරමින් 100,000 ක් දෙනා විශ්ව විද්‍යාලවලට තෝරා නොගැනෙයි.

වැඩෙන සමාජ නොසංසුන්තාවට රාජපක්ෂ තන්ත්‍රය සතුව ඇත්තේ එකම විසඳුමක් පමනි. එනම්, රාජ්‍ය මර්දනයයි. යුද්ධය අවසන්ව ඇතත්, ඒ අවධියේ ගොඩනගන ලද දැවැන්ත පොලිස් රාජ්‍ය යාන්ත්‍රනය එලෙසම පවතිනවා පමනක් නොව තර කෙරෙමින් ද තිබේ. ප්‍රධාන විරුද්ධ පක්ෂ වල සහාය ඇතිව සෑම මසකම කුරිරු හදිසි නීති රෙගුලාසි වතාවතක් ලෙසම පාර්ලිමේන්තුව විසින් අලුත් කරනු ලබයි. ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යටතේ නඩු විමසීමකින් තොරව රඳවා තැබීම් දිගටම සිදුවෙයි. දැඩි ලෙස සන්නද්ධවූ හමුදා භටයන් විසින් කොලඹ හා දිවයින පුරාවට සිදු කරන මාර්ග බාධක, හැඳුනුම්පත් පරීක්ෂාව හා මුර සංචාර, යුද්ධය පැවති අවධියේ තරමටම පුලුල් ලෙස ක්‍රියාත්මක වෙයි. එල්ටීටීඊ සාමාජිකයන් මුලිනුපුටා දැමීමේ කඩතුරාව යටතේ නිවාස ප්‍රදේශ ආශ්‍රිතව ආරක්ෂක හමුදාවන් විසින් කරන පරීක්ෂන මෙහෙයුම් නිතිපතා සිදු කෙරෙයි.

මැයි මාසයේ පටන් ආන්ඩුව, 250,000 කට වැඩි දෙමල වැසියන් "ශුභසාධන ගම්මාන" තුල අනිවාර්ය රැඳවුමක් යටතේ කොටුකර ඇත. ඒ සඳහා විරුද්ධ පක්ෂයේ ප්‍රධාන කන්ඩායම් දෙක වන, එක්සත් ජාතික පක්ෂයත් ජනතා විමුක්ති පෙරමුනත් සහයෝගය දක්වයි. මෙසේ ප්‍රජාතන්ත්‍රීය අයිතීන් අමු අමුවේ උල්ලංඝනය කිරීම, රාජපක්ෂ හා ඔහුගේ දේශපාලන-මිලිටරි කල්ලිය, රටේ ව්‍යවස්ථාවට, නීති පද්ධතියට හා පාර්ලිමේන්තුවට තව දුරටත් තමන්ගේ බැඳීමක් නැතැයි සලකා ගන්නා බව නොවරදින සේ පෙන්නුම් කිරීමකි.

ජනතාව දින නියමයකින් තොරව සිරකඳවුරු තුලට ගාල් කිරීමේ ක්‍රමවේදය, වැඩකරන ජනතාව සිය ප්‍රජාතන්ත්‍රීය අයිතීන් හා ජීවන තත්ත්වයන් වෙනුවෙන් සටනට පිවිසෙන කල ඔවුනට එරෙහිව ද හරවනු ඇති බවට සසප සිය දේශපාලන උද්ඝෝෂනය පුරාම අනතුරු අඟවා තිබුනි. සියලු රැඳවියන් වහාම හා කොන්දේසි විරහිතව නිදහස් කිරීම, කඳවුරු වසා දැමීම, උතුරු නැගෙනහිරෙන් සියලු හමුදා ඉවත් කිරීම හා විපතට පත් එම ජනතාවගේ ජීවිත යලි ගොඩනගා ගැනීමට රුපියල් බිලියන ගනනින් සහන සැලසීම වෙනුවෙන් පක්ෂය තම උද්ඝෝෂනය දියත් කොට තිබුනි.

ආන්ඩුව සමඟ සිය ඇයි හොඳයිකම් පවත්වාගැනීම මගින් ප්‍රධාන විරුද්ධ පක්ෂ කැපී පෙනෙයි. සිංහල ස්වෝත්තමවාදයේ කරවටක් ගිලුනු එජාප හා ජවිපෙ, රාජපක්ෂ යලි ඇරඹූ යුද්ධයට සිය පිටුබලය දුන් අතර, එල්ටීටීඊ පරාජයෙන් ඉක්බිත්තේ "විජයග්‍රහනයේ" පංගුවක් වෙනුවෙන් කාකොටා ගත්හ. එජාප දැන් කියා පාන්නේ, 2000 වසරේ ලත් අන්ත පරාජයෙන් පසුව මිලිටරිය යලි ගොඩනැඟීමට හැකියාව ගෙන දුන්, 2002 එල්ටීටීඊ සමඟ ඇතිකර ගත් සටන් විරාමය දක්ෂ උපායක් බවයි. ජවිපෙ උදම් අනන්නේ, 2005 ජනාධිපතිවරනයෙන් රාජපක්ෂට ජය ගැනීමට උදව් කලේත්, සටන් විරාමය ඉරා දැමීමට එම ආන්ඩුව තල්ලු කලේත් තමන් බවට ය.

දුප්පත්කම හා විරැකියාව උග්‍ර අතට හැරීමට තුඩුදී ඇති ආර්ථික අර්බුදයට, මේ පක්ෂ එකකට වත් පිලිතුරු ඇත්තේ නැත. රටේ ආර්ථික ගැටලු සඳහා එජාප මෙන්ම ජවිපෙ ද දොස් පවරන්නේ "නාස්තිය හා දූෂනය" වෙතය. පාලක කවයන් තුල එය මල්පල ගැන්වී ඇතැයි යන්න නිසැක නමුත්, යුද්ධයේ දැවැන්ත නය කන්දරාව, විදේශ විනිමය අර්බුදය, ඇද වැටෙන වර්ධන අනුපාතයන් හා අපනයන ඉපැයීම් කඩාවැටීම ඊට බලපා ඇති ආකරය සැඟවීම විකාරයකි. ජනතාව මුහුනපාන සමාජ අර්බුදය උත්සන්න කිරීමට පමනක් තුඩුදෙනු ඇති දරුනු කප්පාදු පියවරයන්ට එකඟවී ආන්ඩුව ලබාගත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නයට ද මේ පක්ෂ විරුද්ධ වූයේ නොවේ.

දෙමල පදනමක් සහිත විරුද්ධ පක්ෂ ද ඊට වෙනස් නැත. එල්ටීටීඊ හොරනෑවක් වශයෙන් ක්‍රියාකල දෙමල ජාතික සංධානය (ටීඑන්ඒ), එල්ටීටීඊ පාරාජයෙන් ඉක්බිත්තේ දැන් රාජපක්ෂ ආන්ඩුව සමඟ කරේ අත දමාගෙන සිටියි. දෙමල රැඳවියන් වහාම නිදහස් කිරීමට ඉල්ලීම් නොකරන ටීඑන්ඒ හා එල්ටීටීඊ යන දෙපාර්ශවයම "ජාත්‍යන්තර ප්‍රජාවට" කන්නලව් කරන්නේ රැඳවියන් "කඩිනමින් යලි පදිංචි කිරීම" සඳහා මැදිහත්වන ලෙසයි. ආරම්භයේ පටන්ම නව සමසමාජ පක්ෂයේ හා එක්සත් සමාජවාදී පක්ෂයේ හිටපු රැඩිකල්ලූ, යුද්ධයට පිටුබලය සැපයූ මහා බලවතුන් ද සිර කඳවුරු වල වියදම දරන එක්සත් ජාතීන් ද දෙමල ජනතාවගේ අයිතීන් සුරකින්නේය යන එම මිත්‍යාවම තොරොම්බල් කරති.

බහුතරයක් දෙමල කථාකරන වතු කම්කරුවන් අතර දේශපාලන පක්ෂ හා වෘත්තීය සමිති ලෙස කටයුතු කරන ලංකා කම්කරු කොන්ග්‍රසය (සීඩබ්ලිව්සී) හා කඳුරට ජනතා පෙරමුන (යූපීඑෆ්) යන දෙපාර්ශවයම රාජපක්ෂගේ පාලක සභාගයේ හවුල්කරුවෝ වෙති. සීඩබ්ලිව්සී හා මිත්‍ර සමිති මෑතකදී, දිවයිනේ මිලියන භාගයක් තරම් වන වතු කම්කරුවන් මත ඉදිරි දෙවසර සඳහා රුපියල් 405 ක නැතහොත් ඇමරිකානු ඩොලර් 3.50 ක දරිද්‍රතා මට්ටමේ දෛනික වැටුපක් පැටවූහ. ගිවිසුමට විරුද්ධ බව අඟවන යූපීඑෆ්, කම්කරුවන් අතර පුලුල් ලෙස පැතිර ඇති කෝපය යටපත් කිරීමේ හා සමහන් කිරීමේ උත්සාහයක නිරතව සිටියි.

සසප දේශපාලන සහයෝගය සහිතව බැල්මොරල් වතු යායේ කම්කරුවෝ, මෑතකදී තමන්ගේම ස්වාධීන ක්‍රියාකාරී කමිටුවක් පිහිටුවා ගනිමින්, රැකියා, වැටුප් හා ජීවන තත්ත්වයන් රැකගැනීමේ ප්‍රතිප්‍රහාරයක පලමු පියවර වශයෙන් තමන් ගත් ආරම්භකත්වය අනුගමනය කරන ලෙසට වතුකරයේත් අනෙකුත් වැඩපල වලත් කම්කරුවන් වෙත ඉල්ලීමක් නිකුත් කලහ. ඔවුන්ගේ තීන්දුව ගලා ආවේ, වෘත්තීය සමිතිවල ගොරතර පාවාදීම කෙරෙහි වැඩෙන නොසතුටත්, සමස්ත දේශපාලන සංස්ථාපිතය කෙරෙහි ඇති විරුද්ධත්වයත්, සිය ජීවන තත්ත්වයන් මත එල්ල කෙරෙන නිමක් නැති ප්‍රහාරයන්ට එරෙහිව සටන් වැදිය හැකි සමාජවාදී විකල්පයක අවශ්‍යතාවය වටහාගැනීමත් තුලින්ය.

ක්‍රියාකාරී කමිටුව ගොඩනැඟීම සලකුනු කරන්නේ, ධනේශ්වරයේ සියලු කොටස් වෙතින් කම්කරු පන්තියේ දේශපාලන ස්වාධීනත්වය පිහිටුවා ගැනීම දෙසට තබන ප්‍රථම වැදගත් පියවරක් ලෙසය. සමාජවාදී පිලිවෙත් මත පදනම්වූ කම්කරුවන්ගේ හා ගොවීන්ගේ ආන්ඩුවක් සඳහා සටන තුලට පීඩිත ජනතාවන් දිනාගැනීමට කම්කරුවන්ට හැකි වන්නේ ස්වාධීන බලවේගයක් ලෙස රැලි වීමෙන් පමනකි. එවන් සටනක් හුදෙක්ම ශ්‍රී ලංකාව තුලට පමනක් කොටුවී ගෙනයා නොහැකිය. තමන් වගකීමට බැඳී නැති ගෝලීය ධනවාදයේ අර්බුදය සඳහා බරපැන දැරීමට බලකෙරී ඇති දකුනු ආසියාවේත් ජාත්‍යන්තරවත් තමන් වැනිම කම්කරුවන් වෙත හැරීම ඒ සඳහා අවශ්‍ය කෙරේ.

ශ්‍රී ලංකාව තුල මෙම ඉදිරිදර්ශනය සඳහා සටන් කරන එකම පක්ෂය සසප පමනි. කම්කරුවන්ගෙන්, ගම්වාසීන්ගෙන්, තරුනයන්ගෙන් හා බුද්ධිමතුන්ගෙන් අප ඉල්ලා සිටින්නේ, මැතිවරනයේදී සසපයට තම ඡන්දය පාවිච්චි කරමින් සමාජවාදී විකල්පයක් සඳහා තම සහයෝගය ප්‍රදර්ශනය කරන ලෙසයි. අප කම්කරුවන්ගෙන් හා තරුනයන්ගෙන් උදක්ම ඉල්ලා සිටින්නේ, අපගේ ඉතිහාසය හා ක්‍රියාමාර්ගය අධ්‍යයනය කරන ලෙසත්, කම්කරු පන්තියේ මහජන විප්ලවවාදී පක්ෂය ලෙස සසපය ගොඩනැඟීම සඳහා එයට බැඳෙන ලෙසත් ය.

© www.wsws.org